චක්‍රලේඛ අංක : 2003/18


දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister — 784807, 784832

ලේකම් / செயலாளர் / Secretary — 784811

කාර්යාලය / அலுவலகம் / Office — 785141-50, Fax: 784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : secedu@sltnet.lk

මානව සම්පත් සංවර්ධන, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
மனிதவள அபிவிருத்தி, கல்வி, பண்பாட்டு அலுவல்கள் அமைச்சு
Ministry of Human Resources Development, Education & Cultural Affairs

'ඉසුරුපාය' , ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ බත්තරමුල්ල.
'இசுருபாயா' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை பத்தரமுல்ல.
"Isurupaya", Sri Jayawardhanapura Kotte. Battaramulla.


ඔබේ අංකය / உமது இல. / Your No. } ....................

මගේ අංකය / எமது இல. / My No. } ED/01/12/05/05/01

දිනය / திகதி / Date } 2003 . 05 . 05

සියළුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙතටයි.

## ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම

ඉංග්‍රීසි මාධ්‍යයෙන් උසස් පෙළ විද්‍යා විෂයයන් ඉගැන්වීම යන මැයෙන් යුත් අංක 2001/05 හා 2001.02.23 දිනැති චක්‍රලේඛයට හා "ජාතික සාමාග්‍රිය පාසල් ව්‍යාපෘතිය" යන මැයෙන් වූ 2001.07.26 දිනැති චක්‍රලේඛ ලිපියට ද ඔබගේ අවධානය යොමු කරවමි.

ඉහත සඳහන් චක්‍රලේඛ මගින් උසස් පෙළ විද්‍යා විෂයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීමටත්, 6 වන ශ්‍රේණියේ ගණිතය,පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් හා ශාරීරික අධ්‍යාපනය ද 7 වන ශ්‍රේණියේ සිට ගණිතය, විද්‍යාව හා තාක්ෂණවේදය, සමාජ අධ්‍යානය හා සෞඛ්‍ය හා ශාරීරික විද්‍යාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීමට අනුමැතිය දී තිබේ.

එහෙත් ඇතැම් පාසල්වල ප්‍රාථමික පංතිවලද ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම ආරම්භ කර ඇති බව දැන ගන්නට ඇත. ප්‍රාථමික පංතිවල ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි භාවිතයෙන් හා දෙවන භාෂාවක් වශයෙන් ඉංග්‍රීසි ඉගැන්වීමෙන් ද ළමයින් තුළ ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය වර්ධනය කිරීමට අවශ්‍ය සෑම පියවරක්ම ගත යුතු නමුත් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගෙන නැත. එබැවින් ප්‍රාථමික පංතිවල ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම නොකළ යුතු වේ.

දැනටමත් ඔබ ප්‍රදේශයේ පාසල්වල ප්‍රාථමික පංතිවල ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම ආරම්භ කර තිබේ නම් එය නිවැරදි කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස මෙයින් දන්වන අතර එසේ ආරම්භ කර ඇති පාසල් සම්බන්ධව මෙම අමාත්‍යාංශයට වාර්තා කරන ලෙසද අවධාරණය කරමි.

වී.කේ. නානායක්කාර
ලේකම්
මානව සම්පත් සංවර්ධන අධ්‍යාපන හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

A:\Miscellaneous.doc